# පුංචි රහස් පරික්ෂකයෝ




කෞෂානි දෙව්නෙත්මි ප්‍රනාන්දු

5 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විදුහල

# පුංචි රහස් පරීක්ෂකයෝ


කෞෂානි දෙව්නෙත්මි ප්‍රනාන්දු
කතෘ

5 ශ්‍රේණිය A
**මහාමායා බාලිකා විදුහල**


කතෘගේ වෙනත් කෘති

- හිත හොඳ පූසී
- සිංහ රජතුමා


මහාමායා බාලිකා විදුහල
5 ශ්‍රේණිය A

ප්‍රකාශනය
මුද්‍රණය පෙබරවාරි 2025

ISBN අංකය :ISBN **5-971-206-624-978**

# පිදුම

මා ඇති දැඩි කර පෝෂණය කරන මාගේ ආදරණීය අම්මා තාත්තා සහ අධ්‍යාපනය නැමැති මිලකළ නොහැකි දායාදය ලබා දෙමින් මෙම පොත ලිවීමට මා හට උපදෙස් සහ මහපෙන්වීම ලබාදුන් මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය සහ 5- A පන්තිභාර ගුරුතුමිය ඇතුළු පාසලේ සියලුම ගුරු මෑණිවරුන්ට සහ පියවරුන්ට මෙම කෘතිය පුදකර සිටිමි.



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා  සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

# **<u>සුභාශිංසන පණිවුඩය</u>**

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති  හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන්  සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාලිගාව

2026.05.10

එක්තරා ගම්මානය මිතුරන් තුන්දෙනෙක් සිටියා .ඔවුන්ගේ නම් සමන්, පවන්, සහ රංග.

මොවුන් තිදෙනා ඉතා හොඳ යාලුවෝය.



මෙයාලා ඉන්න ගම කිට්ටුව ගොඩක් ලස්සන ගහක් තියෙනවා . මේ ගහේ ගොඩක් ලස්සන මාළුවෝ ඉන්නවා. ළමයි ගොඩක් මේගහ බලන්න ආවේ මේ ලස්සන මාළුත් බලන්න ඕන නිසා.

ගහේ අනිත් පැත්තේ බය හිතෙන ලොකු කැලෑවක්  තියෙනවා. ඒ වුනත් ඒ කැලෑව දකින අයට මේ කැලෑව ඇතුලට ගිහින් බලන්න ඕනෑකම තිබුණා.



එක දවසක් රෑ මේ කැලෑව පැත්තෙන් බය හිතෙන සද්ද වගයක් ඇහුනා. ගමේ අය මේ සද්ද ගැන එක එක කතා කිව්වා. “මේ ගමට නපුරු කාලයක් එන්න හදන්නේ ” කියලා එයාලා කතා වුනා.



ඒ නිසා මාළු අල්ලන එකත් නැවතිලා වෙනදට ගම වටේ දුවල පැනලා සෙල්ලම් කරන ළමයින්ට මේ දවස්වල සෙල්ලම් කරන්න ගඟ පැත්තට යන්න ගමේ අය යන්න දෙන්නෙ නැති නිසා ගෙවල් වලට වෙලා ඉන්න වුනා.



මේ කාලයේ ඉස්කෝලේ නිවාඩු කාලේ ආවා. සමන්, පවන් වගේම රංග කියන යාළුවෝ තුන්දෙනා මේ නිවාඩු කාලේ කරන දේවල් ගැන කතා වුණා. “ අපි අර ගඟ එහා පැත්තේ තියෙන කැලේ බලන්න යමුද? ” පවන් ඇහුවා.



“අනේ පවන් මෙයා කියන්නේ බය හිතෙන කතාවක්නේ ? ” සමන් වගේම රංගත් කිව්වා. “ඔයා දන්නවානේ පවන් ගමේ අය කියනවා ඒ කැලේ හොල්මන් ඉන්නවා කියලා” රංග කිව්වා “ ඇත්තටම ඒ කැලේ ඒ විදිහේ හොල්මන් ඉන්නවද දන්නේ නැනේ. අපි කොහොමද ඒ බය හිතෙන කැලේට යන්නේ” සමන් කිව්වා.

“ඇත්තමට ඒ කැලෙන් ඇහෙනවා කියන සද්දේ ඉස්සර වෙලාම ඇහුනේ ඔයාටයි ඔයාගේ තාත්තටයි නේද රංග? ” කියලා සමන් රංගගෙන් ඇහුවා. රංග බයෙන් ඔළුව වනලා “ඔව්” කියලා පෙන්නුවා. රංග කැලේට ගොඩක් බයවෙලා කියලා අනිත් යාළුවෝ දෙන්නටම තේරුනා.



නිවාඩු පටන් අරන්ගෙන දින ගානක් ගියා. මේ පුංචි යාළුවෝ තුන්දෙනා කැලේ තියෙන්නේ මොනවද බලන්න කතා වුනා.ඒත් මේ තුන්දෙනාටම ගෙදරින් එළියට යන්න විදිහක් තිබුනෙ නෑ.



මාළු  අල්ලලා විකුණන අයගෙන් පොඩි වෙලාවකට බෝට්ටුවක් ඉල්ලගන්න පුළුවන් වුනත් බෝට්ටුව ඉල්ලන්නේ ඇති කියලා අහන දේට කියන්නට දෙයක් මේ පුංචි යාළුවෝ තුන්දෙනාට නැහැ.

මේ යාළුවෝ තුන්දෙනා “ අපි කැලේ බලන්න යන්න හදන්නේ කිව්වොත් ඒක ගමේ හැමදෙනාටම දැනගන්න ලැබෙනවා  කියලා පුංචි යාළුවෝ තුන්දෙනා දන්නවා ”

මේ වෙලාවේ මේ තුන්දෙනා ඇතින් තියෙන උණ පඳුරක් දකිනවා ඉතින් මෙයාලා ඒ උණ බට වලින් පාරුවක් හදා ගත්තා. මේ හදපු පාරුවෙන් එයාලා ගඟ දිගේ ගිහින් කැලේට ඉක්මනින් යන්න පටන් ගත්තේ සවස් වෙන්න කලින් ආයෙත් ගෙවල් වලට එන්න ඕනෑ නිසා. ඒ වුනත් එයාලා ගඟේ ඉවරට කිට්ටු වෙන කොට හවස් වෙන්න පටන් අරගෙන තිබුනේ. ඒ වුනත් මේ පුංචි යාළුවෝ තුන්දෙනා කැලෑව ඇතුලට ගියා. මෙහෙම කැලෑව ඇතුලේ ඇවිදගෙන යනකොට කැලේ තියෙන බය හිතෙන දේවල් මෙයාලා දැක්කා.



මේ විදිහට පුංචි යාළුවෝ තුන්දෙනා ඇවිදගෙන යනකොට එයාලට අමුතු සද්දයක් ඇහුනා.ඒ මිනිස්සුන්ගේ කටහඬක්. ඒ කටහඬවල් ම තුන්දෙනාගේ ළඟට ටිකෙන් ටික කිට්ටුවෙනවා දැනුනා. ඉතින් මේ පුංචි යාළුවෝ තුන්දෙනා දන්නේම නැතුව පඳුරක් අස්සේ හැංගුනා. හැංගිලා ඉන්න මේ තුන්දෙනා දැක්කා පොරෝ, පිහි, උදළු, කැති, දඬයම් තුවක්කු අතේ තියාගෙන ඉන්න නපුරු මිනස්සු වගයක්.



මේ මිනිස්සුන්ට හැංගිලා ඉන්න අපේ පුංචි යාළුවෝ තුන්දෙනා අහුවුනොත් ගෙදර යන්න වෙන්නේ නෑ කියලා ඒයාලා දැන ගත්තා. ඒ නිසා මේ තුන්දෙනා මේ විදහට කැලේට ආපු එකේ තියෙන බය හිතෙන දේ ඒ තුන්දෙනාටම දැනුනා. මේ මිනිස්සු සත්තු මරන කැලේ ගස් කපන හොරු කියලා මේ තුන්දෙනාට තේරුනා.

මේ මිනිස්සු ගමේ අය කැලේට එන්න දෙන්නේ නැති වෙන්න බය ඇති වෙන සද්ද කරලා තියෙන්නේ කියලා අපේ පුංචි යාළුවෝ තුන්දෙනාට දැනුනා.



දැන් කොහොමද මේ මිනිසුන්ට අහුවෙන්නේ නැතුව මෙතනින් බේරිලා යන්නේ කියලා මේ අය කල්පනා කරනවා අසරන වෙලා මේ විදිහට ගොඩ වේලාවක් පඳුරු අස්සේ හැංගිලා බලන් ඉන්නකොට කළුවරේ ඇතින් දුමක් උඩට යන තැනක පිදුරුවලින් වහලය හදපු මිනිස්සු ඉන්න තැනක් තියෙනවා කියලා මේ තුන්දෙනාට පෙනුනා. මේ තැන ඉන්නේ කලින් දැක්ක පිරිමි අය කියලා පුංචි යාළුවෝ තුන්දෙනා දැක්කා. ඒ මිනිස්සු මොනවා හරි දෙයක් බොන ගමන් හයියෙන් කතාකරනවා දැක්කා. හොඳට බලනකොට ඒ මිනිස්සු වෙරිවෙලා කියලා යාළුවෝ තුන්දෙනා දැනගන්නවා.



මෙන්න මේ වෙලාව තමයි අපිට මෙතනින් පැනගන්න තියෙන්නේ කියලා යාළුවෝ තුන්දෙනාට තේරුනා. ඉතින් මේ තුන්දෙනා අර මිනිස්සු ඉන්න තැනට හොරෙන් හොරෙන් ගිහින් එතන පත්තු කරල තිබුනු ගින්දර ගොඩෙන් ගින්දර කෝටුවක් අරගෙන පිදුරු වලින් වහලය හදලා තිබුනු මඩුවේ වහලයට විසි කරා.

මේ විසිකරපු ගින්දර කෝටුවෙන් වහලය ටිකින් ටික ගිනිගත්තා. එන්න එන්නම ගින්දර වහලය පුරා ගියා. මේ ගින්දර නිසා එතන හිටපු මිනිස්සු කලබල වෙලා වෙරි ගතියෙන් හැමතැනම බයටම දුවන්න පටන් ගත්තා.

ඉතින් මිනිස්සු කලබල වෙලා . වෙරි වෙලා එහෙ මෙහෙ දුවන වෙලාවේ අපේ පුංචි යාළුවෝ තුන්දෙනාත් එතනින් පැනලා ඇවිත් ගඟේ ඉවුරේ තියලා තිබ්බ පාරුවට නැගලා ගමට ගියා. ගමට ගියපු සහන්, පවන් හා රංග  කියන අපේ පුංචි යාළුවෝ තුනදෙනා ගමේ අයට වෙච්ච දේවල් ඔක්කොම කිව්වා. එහෙම කියලා ගමේ අයගේ බය නැති කරා. ඉතින් අපේ ගමේ වීර පුංචි යාළුවෝ තුන්දෙනාට ගමේ  අය ගොඩාක් ආදරේ කරන්න පටන් ගත්තා.



## පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **හේමමාලා උපහාරv** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිර්මාතෘ)